Gmail

**CSR RTI <csr.rti281@gmail.com>**

---

## RTIC/Appeal/832/2022 සහ RTIC/Appeal/833/2022 අංක දරණ අභියාචනා සම්බන්ධවයි

---

**CSR RTI** <csr.rti281@gmail.com> 12 July 2022 at 15:53
To: rti.commission16@gmail.com
Cc: prwalgama@gmail.com, rtikishalipintojayawardena@gmail.com, jagathrtic@gmail.com, jagathliyanarachchi@gmail.com, kishalipintojayawardena@gmail.com, Tharindu Jayawardhana <tharindu.rti@gmail.com>

උපාලි අබේරත්න මයා,
සභාපති,
තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව.
2022.07.12

මහත්මයාණනි,

<u>**RTIC/Appeal/832/2022 සහ RTIC/Appeal/833/2022** අංක දරණ අභියාචනා සම්බන්ධවයි</u>

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 25(3)ට අදාල වන තොරතුරු ඉල්ලීමක් 2022 වර්ෂයේ මැයි මස 24 වන දින තොරතුරු නිලධාරී,පොලිස් මූලස්ථානය සහ තොරතුරු නිලධාරී පොලිස් සැපයුම් කොට්ඨාසය වෙත යොමු කළෙමු. ඊට අදාලව කිසිම ප්‍රතිචාරයක් නොලද නිසා ඒ සම්බන්ධයෙන් නම් කළ නිලධාරී පොලිස් මූලස්ථානය වෙත අභියාචනයක් යොමු කළෙමු. ඊට ද කිසිම ප්‍රතිචාරයක් නොලද නිසා ඔබ කොමිෂන් සභාවට 2022 වර්ෂයේ ජූනි මස 03 වන දින අභියාචනයක් යොමු කළ අතර එම අභියාචනය ජූනි 27 දින විභාගයට ගැනීමට දින නියම විය.

එම අභියාචනයට අදාල නොතීසි ලද පසු පොලිස් සැපයුම් කොට්ඨාසයේ තොරතුරු නිලධාරී විසින් ඉල්ලා ඇති තොරතුරු ප්‍රතික්ෂේප කළ බව සඳහන් ලිපියක් අතින් ගෙනැවිත් බාරදුන්නේය.

ජූනි මස 27 වැනිදා අභියාචනය කැඳවූ අවස්ථාවේදී නොතීසි ලත් පොලිස් මූලස්ථානයේ නම් කළ නිලධාරියා නොපැමිණි අතර අවසාන මොහොතේ වෙනත් දිනයක් ලබා දෙන්නැයි ඉල්ලා සිටි බව කොමිසමේ නිලධාරීන් ප්‍රකාශ කළේය. ඒ අනුව අභියාචනා විභාගය ජූලි 18 වැනිදාට කල් තැබිණි. එම අභියාචනා විභාගය අවසන් වී කොමිසමෙන් පිටව යද්දී පොලිස් සැපයුම් කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරීවරයකු දුරකතන ඇමතුමක් ලබා දී, තම කොට්ඨාසය සූම් ඔස්සේ සම්බන්ධ වීමට අවස්ථාව ඉල්ලූ බවත්, ඊට අදාලව ඊමේල් එකක් එවන ලෙස කොමිසම දැනුම් දුන් බවත්, ඒ අනුව ඊමේල් එකක් එවූ බවත්, තමන්ට සූම් ලින්ක් එක නොලැබුණු බවත් ප්‍රකාශ කළේය.

අපගේ අභියාචනය තොරතුරු පනතේ 25 (3) ට අදාල තොරතුරු ඉල්ලීමකි. පොදු අධිකාරිය ඊට පැය 48ක් ඇතුළත තොරතුරු ලබා දිය යුතුය. එසේ නොවීම සහ කොමිෂන් සභා විභාගයේදී තීන්දුව කල්යාමේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය 09 වැනිදා කඳුළු ගෑස් ප්‍රහාර විශාල ගණනකට අප සහ අරගලකරුවෝ රැසක් ලක්වූහ. බොහෝ පිරිසකට ශ්වසන අපහසුතා ඇතිවිය.

මේ තත්ත්වය සලකා බලා සහ මෙම අභියාචනය 25(3) යටතේ ගැණෙන අභියාචනයක් නිසා එය මෙම සතියේම (ජූලි 13,14,15) විභාගයට ගෙන සුදුසු නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

ස්තුතියි.
මෙයට විශ්වාසී,
අභියාචක
සමාජය හා සාමයික කේන්ද්‍රය (CSR)
0710661417 - තරිඳු ජයවර්ධන

පිටපත් : විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම (කොමසාරිස්)
ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ - ජයවර්ධන (කොමසාරිස්)
ජ්‍යෙෂ්ඨ නීතිඥ ජගත් ලියන ආරච්චි (කොමසාරිස්)